ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2016/12/21 |

## 2016 නොවැම්බර් මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 ඔක්තෝබර් මාසයේ දී වාර්තා කළ සියයට 5.0 හි සිට 2016 නොවැම්බර් මාසයේ දී සියයට 4.1 දක්වා පහළ ගියේය. 2016 නොවැම්බර් මස ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි ආහාර කාණ්ඩය මෙන්ම ආහාර නොවන කාණ්ඩය ද දායක විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2016 නොවැම්බර් මාසයේ දී ද පසුගිය මාසයේ වාර්තා වූ සියයට 4.0 හි නොවෙනස්ව පැවතුණි.

මාසික වෙනස්වීම සැලකූ විට ජා.පා.මි. දර්ශකය 2016 ඔක්තෝබර් මාසයේ වාර්තා වූ දර්ශක අංක 114.7 සිට 2016 නොවැම්බර් මාසයේ දී දර්ශක අංක 116.6 දක්වා ඉහළ ගියේය. මෙම මාසික ඉහළ යෑම සඳහා ආහාර නොවන අයිතම අයත් කාණ්ඩයේ රෙදිපිළි හා පාවහන්; නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; සෞඛ්‍ය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; හා විවිධ භාණ්ඩ හා සේවා උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ ගියේය. තවද, ප්‍රවාහන; සහ ආපන ශාලා සහ හෝටල් උප කාණ්ඩවල මිල ගණන් සුළු වශයෙන් ඉහළ ගිය අතර,

අධ්‍යාපන උප කාණ්ඩයේ මිල ගණන් නොවෙනස්ව පැවතුණි. ආහාර කාණ්ඩය තුළ සහල්, පොල්, එළවළු, දෙහි සහ අර්තාපල් මිල ගණන් මාසය තුළ දී ඉහළ ගියේය.

තවද, මධ්‍යසාර පාන සහ දුම්කොළ උප කාණ්ඩයෙහි මිල ගණන් ද 2016 නොවැම්බර් මාසය තුළ දී ඉහළ ගියේය. මධ්‍යසාර පාන සහ දුම්කොළ; සෞඛ්‍ය සහ සන්නිවේදන උප කාණ්ඩවල දක්නට ලැබුණු මිල ඉහළ යාම් කෙරෙහි නව එකතු කළ අගය මත පනවන ලද බදු අනුපාතයන් ප්‍රධාන වශයෙන් හේතු විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි.ද. මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 ඔක්තෝබර් මාසයේ දී පැවති සියයට 5.7 හි සිට නොවැම්බර් මස දී සියයට 6.8 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2016 ඔක්තෝබර් මස වාර්තා වූ සියයට 5.7 සිට 2016 නොවැම්බර් මස දී සියයට 5.8 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.



**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**
**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජුනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| 2016 | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 | 2.6 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 | 2.7 |
| | ජුනි | 116.1 | 2.1 | 6.4 | 3.1 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 | 3.4 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 | 3.6 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 | 3.8 |
| | ඔක්තෝබර් | 114.7 | 1.1 | 5.0 | 4.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 | 4.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව